# බළන්ගොඩ නගර සභාව

## 2022-08-19 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.08.19**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රීනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රීනී | එම්.ශාන්තිලේඛා මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පෙ.ව 10:07 ට සභාවට පැමිණෙන ලදී.**
**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පෙ.ව 10:21 ට සභාවට පැමිණෙන ලදී.**

01. 2022-09-23 සිට 2022-10-02 දින දක්වා සංගීත සැණකෙළියක් පැවැත්වීම සඳහා බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකා ප්‍රසංග සම්බන්ධීකාරක,සැණකෙළි උපාංග සම්පාදක, කලා හා සංස්කෘතික සංගමය විසින් 2022-09-23 සිට 2022-10-02 දින දක්වා සංගීත සැණකෙළියක් පැවැත්වීම සඳහා බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ද මෙය රුපියල් ලක්ෂ 120 ක ව්‍යාපෘතියක් බවට දැනගන්නට ලැබුණු අතර, ක්‍රීඩාපිටිය නඩත්තු කටයුතු සඳහා විශාල මුදලක් වැය වෙන බැවින් සභාවේ අදායම පිළිබඳව සිතිය යුතු බව ද පසුගිය සභා වාරයක දී සංගීත ප්‍රසංග සඳහා ක්‍රීඩා පිටිය ලබා දීමේ දී 25% ක විනෝද බද්දක් අය කිරීම හා ක්‍රීඩා පිටිය හා ප්‍රේක්ෂකාගාරය වෙනුවෙන් මුදල් අය කිරීම ගැන සභා තීරණයක් ගත් අතර, මෙම සංගීත ප්‍රසංගය දින 10ක් පවතින නමුත් ප්‍රසංගයට සූදානම් වීම හා ප්‍රසංගයෙන් පසු අදාල උපාංග සවි කිරීම හා ඉවත් කිරීම සඳහා තවත් දින 05ක් ගත විය හැකි බැවින් දින 15 කට ක්‍රීඩා පිටිය වෙන් කිරීමට සිදු වන බව ද ක්‍රීඩා පිටියෙහි ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර මේ සම්බන්ධව ක්‍රීඩා උපදේශකවරුන්ගේ අදහස් ලබා ගැනීම සුදුසු බව ද පවසන ලදී.

ඒ අනුව ක්‍රීඩා උපදේශකතුමා සමඟ අදාල කරුණු සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් මීට පෙර සංගීත ප්‍රසංග සඳහා ක්‍රීඩා පිටිය ලබා දුන්නේ දවසකට හෝ දෙකකට පමණක් වුවත් මෙය දින 10 ක් පවතින සැණකෙළියක් බව ද සැණකෙළියට පෙර හා පසු දින ගණනක් අදාල ද්‍රව්‍ය ස්ථානගත කිරීමට හා ඉවත් කිරීමට ලබා දුන් විට සම්පූර්ණ දින 15 ක් පමණ ගත වන බව ද බළන්ගොඩ දරුවන්ට පවතින එකම ක්‍රීඩා පිටිය මෙය වන බැවින් දින 15 ක් ක්‍රීඩා කටයුතු සඳහා අවස්ථාව නොලැබීම මත ක්‍රීඩාව සඳහා හානියක් සිදු වන බව ද සභාවට ආදායම අවශ්‍ය නමුත් ක්‍රීඩා ගුරුවරයෙක් වශයෙන් ක්‍රීඩාවට සිදු වන හානිය නිසා තමන් මෙම යෝජනාවට විරුද්ධ බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා පැවසූයේ දෛනිකව ක්‍රීඩාවේ නියැලෙන පිරිස් සිටින අතර, මෙම කාලය තුළ දරුවන්ට ක්‍රීඩා කටයුතු සිදු කිරීමට නොහැකි වන බැවින් තමන් මෙම යෝජනාවට තරයේ විරුද්ධ බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සභාවට ආදායම අවශ්‍ය වන නමුත් එදිනෙදා ක්‍රීඩාවේ යෙදන්නන් පිළිබඳව සැලකිලිමත් විය යුතු බව ද දින 15 ක කාලයකට ක්‍රීඩා පිට්ටනිය ලබා දුන් විට සාමාන්‍ය ජන ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් වන බව ද ක්‍රීඩාංගනය ආරක්ෂා කිරීම අසීරු වී ඇති අතර, එහි සංවර්ධනය වෙනුවෙන් එක් අවස්ථාවක රුපියල් ලක්ෂ 50 ක් හා රුපියල් ලක්ෂ 20 ක් බැගින් ලබා ගත් නමුත් සංවර්ධන වැඩවලින් 10%ක ප්‍රමාණයක් ඉතුරු වී ඇති බව ද ඒ සඳහා ඉන්ධන හිඟය ඇතුළු විවිධ හේතු බලපෑ අතර, ක්‍රීඩා පිටිය යම් කිසි මට්ටමකට ගැනීමට උපරිම උත්සාහ ගන්නා බව ද ක්‍රීඩා උපදේශකවරුන්ගේ සහය අගයන බව ද ක්‍රීඩාංගනයේ පවතින තත්ත්වය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ගැනීම පළමු කාර්යය විය යුතු අතර, ඒ සඳහා කොන්දේසි හා වගන්ති සකස් කර අත්සන් ගැනීම කළ යුතු බව ද පැවසීය.

එමෙන්ම ක්‍රීඩා පිටිය සංගීත ප්‍රසංගය සඳහා ලබා දෙන්නේ නම් ඉන් ලැබෙන ආදායම ක්‍රීඩා පිට්ටනියේ සංවර්ධන කටයුතු සඳහා පමණක් යොදවමින් එය දියුණු තත්ත්වයකට පත් කිරීම සුදුසු බව වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුයේ ක්‍රීඩාව හා ආදායම යන සියල්ල සම්බන්ධවම සිතිය යුතු අතර, ක්‍රීඩා පිටියට හානියක් නොවන පරිදි අධීක්ෂණයක් යටතේ මෙම සංගීත සැණකෙළියට අවසර ලබා දීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් රත්නපුර මහ නගර සභා ක්‍රීඩා පිටිය ක්‍රීඩාව හැර වෙනත් ක්‍රියාවන් සඳහා ලබා නොදෙන අතර, පිළිවෙලකට පවතින බව ද සංගීත ප්‍රසංග සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් ලබා ගැනීමට හැකි බව ද බළන්ගොඩ ක්‍රීඩා පිටිය දිගින් දිගටම සංගීත ප්‍රසංග සඳහා ලබා දීමට තමන් විරුද්ධ අතර සභාවට ආදායමක් අවශ්‍ය බැවින් කොන්දේසිවලට යටත්ව මෙම ප්‍රසංගය සඳහා අවසර ලබා දෙන ලෙස ද ලබන වසරේ සිට ප්‍රතිපත්ති සකස් කර බළන්ගොඩ නගරයේ පවතින වටිනා සම්පතක් වශයෙන් මෙම පිට්ටනිය දියුණු තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කළ යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය පැවසූවේ ක්‍රීඩා පිටිය ලබා දෙන්නේ නම් වගන්ති ඇතුලත් කර, අලාභ හානියක් සිදු වුවහොත් අය කර ගැනීමට තැන්පත් මුදල වැඩි කිරීම සුදුසු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මෙරිගෝ රවුම් ඇතුළු විවිධ අංග සඳහා විශාල වලවල් හෑරීම නිසා පිට්ටනියට හානි සිදු වන බැවින් එම උපාංග පිට්ටනියට ඉහළ කොටසේ සවි කිරීමට සැලසීමත්, සියලුම දේ සලකා බලා පිට්ටනියේ ආරක්ෂාව වෙනුවෙන් දින 03 කට ලබා දීම සුදුසු බවත් සභාවේ මන්ත්‍රීවරුන් අධීක්ෂණ කමිටුවක් වශයෙන් පත් කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය පැවසූයේ සැණකෙළි නගරයට අත්‍යවශ්‍ය බවත්, එම කාල වකවානුව සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මීට පෙර සභාවන්වල දී දවස් කිහිපයක් සඳහා ක්‍රීඩා පිටිය ලබා දීම සම්බන්ධව සභා තීරණයක් නොගත් අතර, එක් දවසකට විනෝද බද්ද 25%ක් අය කළහොත් ප්‍රසංගය පවතින දවස් 10 සඳහාම විනෝද බද්ද අය කිරීමට සිදු වන බවද එසේ අය කිරීමේ දී ඇතුල්වන ස්ථානයේ මෙන්ම ඇතුලත පවතින අංග සඳහා නිකුත් කරනු ලබන ටිකට් පත්වලින් ද 25%ක් අය කිරීමට සිදු වන අතර, ඒ සඳහා සභාවේ නිළධාරීන් යෙදවීම හා අධීක්ෂණය සිදු කිරීමට සිදු වන බව ද පවසන ලදී. එමෙන්ම ක්‍රීඩා කටයුතු සඳහා පිට්ටනිය වෙන් කළ යුතු බවට අදහස් ලැබුණු නමුත් වර්ෂයෙන් දින කිහිපයක් පමණක් විවිධ ක්‍රියාකාරකම් සඳහා ලබා දීමේ ගැටලුවක් නොමැති බව ද විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු නිසා තමන් මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළ අතර ඒ අනුව සභා තීන්දුවක් ලබා දෙන ලෙස ද වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ අදාල සංවිධායකයන් මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර, එහි දී ඔවුන් 25% ක් ගෙවීමට කැමත්ත පළ නොකළ බවත්, යහසාධක සංගමයට ලබා දීමට අදහස් කරන මුදල පමණක් ලබාදීම ඔවුන්ගේ අදහස වී ඇති බවත්ය.

මෙම සංගීත ප්‍රසංගය සඳහා ක්‍රීඩා පිටිය ලබා දීම සම්බන්ධව ලේකම්තුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

එහි දී ලේකම්තුමා සංගීත ප්‍රසංගය සඳහා ක්‍රීඩා පිටිය ලබා දෙන්නේ නම් 25%ක විනෝද බද්ද අය කිරීම සුදුසු බව පැවසූ නමුත් ඒ වෙනුවෙන් ලබා ගන්නා වූ මුදල් ක්‍රීඩා පිට්ටනියේ සංවර්ධනය වෙනුවෙන් පමණක් යෙදවීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා දැඩි ආර්ථික දුෂ්කරතාවයකට බළන්ගොඩ නගර සභාව පත්ව ඇති නිසා සංගීත සැණකෙළිය පවත්වනු ලබන දින 10 ක කාලය වෙනුවෙන් රුපියල් 750,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බවට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ඇති වූ දීර්ඝ සාකච්ඡාවෙන් පසු,

- 2022-09-23 සිට 2022-10-02 දින දක්වා සංගීත සැණකෙළිය පැවැත්වීම සඳහා රුපියල් ලක්ෂ 05 ක මුදලක් අදාල ප්‍රසංග සංවිධායකවරුන්ගෙන් අය කර ගැනීම (ගිවිසුම්ගත වන අවස්ථාවේ අනිවාර්යෙන් මෙම මුදල අය කර ගත යුතුය.)

- ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය සඳහා එක් දිනකට රු. 5,000.00 බැගින් දින 15 ක් (සැණකෙළිය පවත්වන දින 10 හා පැවැත්වීමට පෙර හා පසු දින 05 ක්) සඳහා රු.75,000.00ක් අය කර ගැනීම (ගිවිසුම්ගත වන අවස්ථාවේ අනිවාර්යෙන් මෙම මුදල අය කර ගත යුතුය.)
- ක්‍රීඩා පිටියට යම් කිසි අලාභහානියක් සිදු වුවහොත් පියවා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 05 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීම
- සැණකෙළිය පැවැත්වෙන දින 10 ක කාලය සඳහා විදුලි සැපයුම අදාල ප්‍රසංග සංවිධායකවරුන් විසින්ම සලසා ගැනීම හා ක්‍රීඩා පිටියට වාහන ඇතුලත් නොකිරීම ඇතුලුව ඇතුලත් කිරීමට ඇති සියලුම කොන්දේසිවලට යටත්ව 2022-09-23 සිට 2022-10-02 දින දක්වා සංගීත සැණකෙළිය පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

02. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 5/10/2017 හා 2017-05-17 දිනැති චක්‍රලේඛය අනුව රාජකාරී වේලාවෙන් පරිබාහිරව හිඟ වරිපනම් බදු එකතු කිරීම වෙනුවෙන් පහත නම් සඳහන් නිළධාරීන් වෙත 10%ක කොමිස් මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- අචිනි ශෂිකලා මිය,
- කේ.ඩී.සී. සම්පත් කුමාර මයා,
- එම්.එච්.එම්.නස්ලි මයා
- එම්. සෙල්වරාණි මිය
- පී.එන්.ලුම්බිණි කුමාරි මිය
- චාතුල්‍යා දෙනිපිටිය මිය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පසුගිය වසර දෙකක පමණ කාලය තුල කොරෝනා වසංගතය හා රටේ පැවති අයහපත් තත්ත්වය හමුවේ ජනතාව විසින් වරිපනම් බදු ගෙවීම් සිදු නොකළ නිසා සභාවේ ආදායම් තත්ත්වය අඩු වී ඇති අතර,රුපියල් ලක්ෂ 55 ක පමණ හිඟ වරිපනම් බදු මුදලක් අය කර ගත යුතුව ඇති බව ද සභාවේ ආදායම් පරීක්ෂක තනතුරු තුනම පුරප්පාඩු වී ඇති නිසා වෙනත් සුදුසු නිලධාරීන් යොදවා එම කාර්යයන් ඉටු කර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබා දී ඇති බව ද ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 5/10/2017 හා 2017-05-17 දිනැති චක්‍රලේඛය අනුව රාජකාරී වේලාවෙන් පරිබාහිරව හිඟ වරිපනම් බදු එකතු කිරීම සඳහා 10%ක කොමිස් මුදලක් ගෙවීම සුදුසු බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

03. පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල වන රු. 98,462.74 ක මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල රු. 319,800.49 ක් වන නමුත් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තැබීම නිසා හා 2021 අප්‍රේල් මස සිට නොවැම්බර් මස දක්වා කාලය තුල ධාවනය වූ දෛනික බස් රථ සංඛ්‍යාව 50ට අඩු වීම නිසා හිඟ මුදල් ගෙවීමට නොහැකි බවත්, ඒ වෙනුවෙන් සහනයක් ලබා දෙන ලෙසත් ටෙන්ඩර්කරු වන ඩී.එම්.එස්.එන්.සේනානායක යන අය විසින් ඉල්ලීම් කර ඇති බව ද ඒ අනුව සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් ලබා දුන් වාර්තාවන් සැලකිල්ලට ගෙන එම කාල සීමාවට අදාලව ගාස්තු අය කිරීමේ දී සහන ලබා දුන් බව ද පවසන ලදී.

එමෙන්ම ධාවනය වූ බස් ප්‍රමාණය අනුව ගණනය කළ විට ටෙන්ඩර්කරු විසින් 2021 වර්ෂයට අදාලව ගෙවීමට ඇති මුදල රු.740,634.05 ක් වන නමුත් මේ වන විට ගෙවා ඇති මුදල රු. 642,171.31 ක් වන අතර, තවදුරටත් ගෙවීමට ඇති හිඟ මුදල රු. 98,462.74 ක් වන බව ද මෙම මුදල ගෙවීමට අදාල ටෙන්ඩර්කරු කැමැත්ත ප්‍රකාශ කර ඇති බව ද නීතිමය කටයුතුවලට යොමු වුවහොත් ඒ සඳහා දෙපාර්ශවයටම මූල්‍ය අලාභයක් සිදු වන බැවින් නීතිමය කටයුතුවලට නොගොස් මෙම හිඟ මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද ගරු සභාපතිතුමා වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාලව 2021 වර්ෂයේ අය වීමට ඇති හිඟ මුදල වන රු. 98,462.74 ක මුදල අය කරගෙන 2021 වර්ෂයේ ටෙන්ඩරය අවසන් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.10 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.ඒ වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.